# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023**

**2026 ජනවාරි/පෙබරවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

## සාහිත්‍ය විචාරය

**(නව නිර්දේශය)**

**විසිවන සියවසෙහි සිට විසිඑක්වෙනි සියවස තෙක් අපරදිග සාහිත්‍ය නිර්මාණ සහ විචාර අධ්‍යයනය**

## LTCR 38224

ප්‍රශ්න 10න් ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නූතන යුගයෙහි සමාජ-දේශපාලන සන්දර්භයෙහි ඇති වූ වෙනස්කම් නූතනවාදයේ (Modernism) ප්‍රභවය කෙරෙහි බලපෑ ආකාරය නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

02. ඩී. එච්. ලෝරන්ස්ගේ කෘති වෙත මූලික අවධානය යොමුකරමින් නූතනවාදී ඉංග්‍රීසි සාහිත්‍යයේ අනන්‍යතා ලක්ෂණ සාකච්ඡා කරන්න.

03. "පශ්චාත් නූතනවාදය (Post Modernism) යනු නූතනවාදයෙහිම දිගුවකි." සත්‍යාසත්‍යතාව විමසන්න.

04. "අන්තිම දුම්රිය (Train to Pakistan) නවකථාව මගින් ඉන්දියාව දෙකඩවීමේ ඛේදනීය අතුරුඵල නිරූපිතය." උදාහරණ සහිතව පහදන්න.

05. අධියථාර්ථවාදය (Surrealism) සංකල්පය චිත්‍ර කලාව ආශ්‍රයෙන් විග්‍රහ කරන්න.

06. 'රූප විපර්යාසය' කේන්ද්‍ර කොට ගනිමින් ප්‍රාන්ස් කෆ්කාගේ නිර්මාණවල ගැබ්වන අධියථාර්ථවාදී ලක්ෂණ පැහැදිලි කරන්න.

07. "නිකොලොයි ගොගොල්ගේ ඇතැම් නිර්මාණවල අධියථාර්ථවාදී ලක්ෂණ ගැබ් වේ." උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

08. "ටී. එස්. එලියට්ගේ මුඩුබිම (The Waste Land) පශ්චාත් යුද වාතාවරණයක මරණයේ ඛේදජනක මුහුණුවර කුළුගන්වන කෘතියකි." විමසන්න.

09. පිටස්තරයා නවකථාව පිළිබඳ හැඳින්වීමක් කරන්න.

10. සාංදෘෂ්ටිකවාදය හඳුන්වා එහි පුරෝගාමීන් පිළිබඳ සාකච්ඡා කරන්න.

*******************************